# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,754 — 1961 නොවැම්බර 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 2 වෙනි නියෝගයෙන් මා වෙත පවරා ඇති බලකල අනුව අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම 6 වෙනි නියෝගයෙහි කාර්යයන් සඳහා නිසි බලධාරීන් වීමට පහත සඳහන් නිලධාරීන් කිහිප දෙනා මෙයින් පත් කරමි :—

(1) සහකාර සුප්‍රින්ටැන්ඩන්ට්වරයකුගේ තත්ත්වයට අඩු නො වන යම් පොලිස් නිලධාරියකු.

(2) ලංකා යුද්ධ හමුදාවේ යම් අධිකාරි ලැබූ නිලධාරියකු.

(3) රාජකීය ලංකා නාවුක හමුදාවේ යම් අධිකාරි ලැබූ නිලධාරියකු.

(4) රාජකීය ලංකා ගගන හමුදාවේ යම් අධිකාරි ලැබූ නිලධාරියකු.

(5) ආණ්ඩුවේ යම් දිසාපතිවරයකු හෝ සහකාර දිසාපතිවරයකු.

(6) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සභාපති.

(7) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ නේවාසික අධිකාරී.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1961 නොවැම්බර 11.
කොළඹ.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2023—ජේ. ඇන්. ආර් 20196—6,400 (61/11)